**මොරටුව මහා නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 19 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 අගෝස්තු 17 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මොරටුවමහා නගර සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) ගිණුම් වලින් අත්හැරීම්**

පහත අත්හැරීම් නිරීක්ෂණය විය.

(i) 2010 ජුලි - 2011 දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට යැවිය යුතු රු.2,246,530 ක්,

(ii) වැටුප් රහිත නිවාඩු සඳහා සේවකයින් 33 දෙනෙකුගෙන් අයවිය යුතු රු.225,615 ක්,

(iii) ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා වෙන් කිරීම්.

(iv) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියෙන් ලැබී තිබුණු අත්ට්‍රැක්ටරයක, ට්‍රේලරයක හා මෝටර් බෝට්ටුවක වටිනාකම් වල එකතුව වූ රු.795,000 ක්,

**(ආ) ගිණුම් වල අඩුවෙන් දැක්වීම්**

පහත සඳහන් අඩුවෙන් ගිණුම්ගත කිරීම් නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයේ අවසානයට,

(i) වරිපනම් සඳහා දුන් වට්ටම් රු.1,999,700 ක්,

(ii) ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.274,626 ක්, හා

(iii) ඉතිරි කිරීමේ ආයෝජන රු.22,970 ක්,

(iv) දක්වා තිබූ කේවල වියදම් ණයගිම් ශේෂ වල එකතුව පරීක්ෂා කර බැලීමේදී රු.16,644,033 ක අඩුවක් නිරීක්ෂණය විය.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් විෂයයන් 17 ක සංඛ්‍යාවන් සහ ඊට අදාල උපයෝගී ලේඛන වල දැක්වෙන සංඛ්‍යාවන් අතර, එකතුව රු.74,796,788 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ණයගිම් ශේෂ වල එකතුව රු.114,788,977 ක් වූ අතර, ඊට ඇතුළත් රු.4,141,950 ක ශේෂයක් අවුරුදු 10 ක කාලයක් ඉක්මවා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසානයට ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ වල එකතුව රු.50,744,483 ක් වුවද, ඉදිරිපත් කර තිබුණු වයස් විශ්ලේෂණයට අනුව එකතුව රු.51,437,353 ක් විය. මෙම තැන්පතු ශේෂ වලින්, වර්ෂ 03 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂ වල එකතුව රු.27,981,052 ක් වූ අතර, වර්ෂ 05 ත් 10 ත් අතර කාලයකට අයත් වූ ශේෂ වල එකතුව රු.22,379,222 ක් වී තිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් වලින් 06 කට හා ඉකුත් වර්ෂ 05 සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 15 කට 2012 ජුලි 17 දින වන විටත් පිළිතුරු ලැබී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ පිළිතුරු නොලත් විගණන විමසුම් වලට භාජනය වූ ගණනය කලහැකි ගනුදෙනු වල වටිනාකම රු.2,567,702 ක් විය.

**(ආ)** තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 274,376,111 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඇ) ගෙවීම් වවුචර් විගණනයට ඉදිරිපත් නොකිරීම

එකතුව රු.6,146,521 ක් වූ ගෙවීම් වවුචර් 40 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.889,564 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.29,406,241 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌණතා / අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.3,167,577 ක් වැඩිපුර පොලි ගෙවා තිබූ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 162.25 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

(ආ) එක් බැංකු ගිණුමක 2011 දෙසැම්බර් 31 දිනට රු.45,908 ක අක්‍රීය ශේෂයක් පැවතුණි.

(ඇ) නිකුත් කර මාස 06 ක කාලයක් ඉක්මවූ එකතුව රු.839,003 ක් වූ චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි 396 හි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 පෙබරවාරි 22 උන සිට දෙසැම්බර් 27 දක්වා කාලය තුල ලියන ලද එකතුව රු.94,065 ක් වූ චෙක්පත් 05 ක් 2012 අප්‍රේල් 23 දින වන විටත් ඒවායේ හිමිකරුවන්ට නිකුත් නොකර විෂය ලිපිකරු භාරයේ රඳවා ගෙන තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වියදම් වෙනුවෙන් සාමාන්‍ය ගිණුමෙන් ලියා තිබුණු එකතුව රු.4,418,761 ක් වූ චෙක්පත් 12 ක් සහ සේවක ණය ගිණුමෙන් ලියා තිබූ එකතුව රු.1,458,245 ක් වූ චෙක් පත් 02 ක් ද, විමධ්‍යගත අරමුදල් ගිණුමෙන් ලියා තිබුණු

එකතුව රු.338,924 ක් වූ චෙක්පත් 08 ක් ද එම ගිණුම් වල මුදල් නොමැති වීම මත අත්සන් නොකර විෂය ලිපිකරු භාරයේ රඳවා ගෙන තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) | වරිපනම් බදු | 85,717 | 42,389 | 131,315 |
| (ii) | බඳු කුලී | 8,059 | 6,655 | 4,108 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 14,435 | 6,834 | 43,057 |
| (iv) | වෙනත් ආදායම් | - | 263,883 | - |

සමාලෝචිත වර්ෂයට අදාල ඇස්තමේන්තුගත වරිපනම්, බදු කුලී හා බලපත්‍ර ආදායමින් 52% ක් පමණක් අය කර තිබුණි.

### 2.3.2 ව්‍යාපාර බදු අයකිරීම

සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර බදු අයකරගත යුතු ආයතන 2,332 ක් ලෙස හඳුනාගෙන තිබුණද, ආයතන 945 කින් පමණක් බදු අයකර ගෙන තිබුණි. ඒ අනුව, 59.47% ක් හෙවත් ආයතන 1,387 කින් බදු අයකර නොතිබුණි. හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.3,418,700 ක් වූ නමුත්, එම මුදල් අයකර ගැනීමට මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.3.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය සඳහා බලපත්‍ර නිකුත් කල යුතු වෙළඳ සැල් සංඛ්‍යාව 2,350 ක් ලෙස හඳුනාගෙන තිබුණද, වෙළඳ සැල් 108 ක් පමණක් බලපත්‍ර ලබා ගෙන තිබුණි. ඒ අනුව 95.4% ක් හෙවත් වෙළඳසැල් 2,242 ක් බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ බලපත්‍ර ගාස්තු වටිනාකම රු.24,161,855 ක් බැව් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

## 2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

(අ) පහත විස්තර සඳහන් වාහන හා යන්ත්‍ර දිගු කාලයක සිට ධාවනයෙන් ඉවත් කර තිබුණද, එකී වාහන සහ නැවත අළුත්වැඩියා කිරීමට හෝ බැහැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

| | වාහනය/ යන්ත්‍රය | | වටිනාකම<br>රු. |
|---|---|---|---|
| (i) | ට්‍රැක්ටරය | 08 | 3,043,000 |
| (ii) | කම්පැක්ටර් | 02 | 6,812,730 |
| (iii) | ගිනි නිවීමේ රථ | 01 | 100,000 |
| (iv) | යතුරු පැදි | 01 | 35,000 |
| (v) | මාර්ග තලන | 01 | 4,630,000 |
| (vi) | මාර්ග තලන | 02 | වටිනාකම දක්වා නොමැත |
| (vii) | ගලි බවුසර් | 02 | 1,500,000 |
| (viii) | චේන් ඩෝසර් | 01 | 500,000 |

(ආ) ගිනි නිවීමේ ඒකකයක් සඳහා ලැබී තිබූ වටිනාකම රු.4,304,195 ක් වූ ගිනි නිවන රථ 03 ක්ද, වටිනාකම රු.4,000,000 ක් වූ වතුර බවුසරයක්ද, වටිනාකම රු.3,237,442 ක් වූ ගිලන් රථ දෙකක්ද, ජල සම්පාදන මණ්ඩලයෙන් ලබාදී තිබූ වටිනාකම රු.4,000,000 ක්වූ වතුර බවුසරයක්ද ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපිත නොකිරීම නිසා අභාවිතව තිබුණි.

## 2.5 ආර්ථික නොවූ ගණුදෙනු

1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ සහ ඊට අදාල සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාර දායකමුදල් නොගෙවීම නිසා, 1999 ජුනි සිට 2010 ජුනි දක්වා කාලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.285,247 ක අධිභාර ගෙවා තිබුණි.

## 2.6 මෙහෙයුම් / කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිර්ක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 218 වැනි වගන්තියේ විධිවිධාන අනුව, එක් එක් වර්ෂය සඳහා සභාවේ පරිපාලනය පිළිබඳ වාර්තාවක්, මූලා ප්‍රකාශන සමඟ සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂ වල එකතුව රු.5,784,942 ක් විය.

(ඈ) 2010 අගෝස්තු 25 දින විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛය අනුව, සභා බල ප්‍රදේශය තුල සවිකර ඇති අනවසර විථිපහන් 2,489 ක් විධිමත් කිරීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබීම නිසා විදුලි බල සමාගම ඒවා අනවසර විථිපහන් සේ සලකා තිබුණි. සමාලෝචිත වර්ෂයට අවසානයට විථිපහන් සඳහා ලැබිය යුතු රු. රු.8,631,016 ක මුදලක් ලබා ගැනීම අවිනිශ්චිතව පැවතුණි.

(ඈ) 2006 වර්ෂයේදී සහ ඊට පෙර ලැබී තිබුණු ඇස්තමේන්තු අගය රු.2,600,000 ක් වූ ගිලන් රථ දෙක ලියාපදිංචි කිරීම හා ගිණුම් ගත කිරීම සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සිදු කර නොතිබුණි.

(ඉ) 1993 අංක 18 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 46 දරන පනතේ 37 වගන්තියේ විධිවිධාන ප්‍රකාර අංක II දරන ආකෘතියෙන් යැවිය යුතු හය මාසික වාර්තා, යැවීමේ දීර්ඝ ප්‍රමාදයක් වීම.

(ඊ) 1999 වර්ෂයේදී රු.3,406,365 ක පිරිවැයට මිලදී ගෙන තිබුණු අංක 226-2026 දරන කම්පැක්ටර් රථය කිසිම ගිවිසුමකින් තොරව 2010 ඔක්තෝබර් මාසයේදී බොරලැස්ගමුව නගර සභාව වෙත මුදා හැර තිබුණි.

(උ) සංයුක්ත සැලැස්මක් හා සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂය සඳහා රඳවා ගෙන තිබූ වැටුප් ප්‍රතිපූර්ණ 15% නිදහස් කිරීම සඳහා පළාත් පාලන දොපර්තමේන්තුව විසින් හඳුන්වාදී තිබූ නිර්නායක සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම නිසා රු.10,462,646 ක රඳවා ගැනීම් නිදහස් කිරීම පතික්ෂේප කර තිබුණි.

(එ) 1962 මාර්තු 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතට පනවන ලද අංක 7(2)(බී) නියෝගය ප්‍රකාර, 2006 වර්ෂය සම්බන්ධයෙන් අයකර යවන ලද දායක මුදල් පිළිබඳ විස්තර ඇතුළත් සී (3) ආකෘතිය ප්‍රකාර හයමාසික වාර්තා 2012 අප්‍රේල් 30 දින වන විටත් යවා නොතිබීම නිසා අයකර යවන ලද දායක මුදල් ඒ ඒ සාමාජිකයින්ගේ කෝවල ගිණුම් වලට "බැර" වී නොතිබුණු අතර, එම මුදල් අවිනිශ්චිත ගිණුමට "බැර" වී තිබුණි.

## 2.7 තොග පාලනය

------------------

පහත සඳහන් ගිණුම් තැබීමේ අඩුපාඩු හේතුවෙන්, වර්ෂයේ පරිභෝජන වියදම හා රු.23,253,070 ක තොග ගබඩා ශේෂය මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව පෙන්නුම් කෙරෙතැයි යන්න විගණනයේදී තහවුරු නොවිණ.

(i) 2011 ජූලි 31 දින දක්වා තොග මිලදී ගැනීම් වැය ශිර්ෂ වලට ‘‘හර’’ කර තිබීම.

(ii) 2011 අගෝස්තු සිට පරිභෝජනය කරන ලද තොග වල පිරිවැය ගිණුම් වලට ඇතුළත් කර නොතිබීම.

(iii) 2008 වර්ෂයේ සිට වෙනස්වීමකින් තොරව ඉදිරියට ගෙන එන රු.20,789,460 ක ශේෂයක් පොදු ගබඩා ශේෂය තුල ඇතුළත්ව තිබීම.

(iv) 2011 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මිලදී ගෙන තිබුණු රු.2,463,610 ක වටිනාකම් ඇතුළත් වී නොතිබීම.

(v) වර්ෂය අවසානයට තොග ශේෂ ගණන් බලා නොතිබීම.

(vi) තොග ලෙජරය සසඳා නොතිබීම.

## 2.8 නිවාස සැලැසුම් අනුමත කිරීම සහ සහතික නිකුත් කිරීම

සමාලෝචිත වර්ෂය අවසානයට නිකුත් කිරීමට ඉතිරිව තිබුණු සැලැසුම් සහ සහතික වල තත්ත්වය පහත දැක්වෙන පරිදි විය.

| විස්තරය | | වර්ෂය | | එකතුව |
|---|---|---|---|---|
| | | 2010 | 2011 | |
| i. | බිම් කට්ටි සැලැසුම් | 122 | 178 | 300 |
| ii. | ගොඩනැගිලි ඉදිකිරීම් සහ අමතර එකතු කිරීම් | 73 | 95 | 168 |
| iii. | අනුකූලතා සහතික නිකුත් කිරීම් | 46 | 48 | 94 |
| | | 241 | 321 | 562 |

## 3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ණයගැති/ ණයහිමි පාලනය
(උ) සේවක මණ්ඩල කළමනාකරණය